# ඉතිවුත්තකපාළිය පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයක්

ඇහැලේපොල මහින්ද හිමි

## ප්‍රවේශය

පාලි භාෂාව යනු ථෙරවාදී බුදුසමයෙහි භාෂා මාධ්‍යයයි. එය මධ්‍ය ඉන්දු ආර්ය භාෂා යුගයට අයත් සම්භාවනීය පැරණි භාෂාවකි. ථෙරවාද බුදුසමයට අයත් පිටක[1] අනුපිටක සුවිශාල සාහිත්‍ය වංශය රචනා වී ඇත්තේ පාලි භාෂාවෙනි. සූත්‍ර පිටකාගත ඛුද්දකනිකායේ[2] ඉතිවුත්තකපාළිය පිළිබඳ ව සංක්ෂිප්ත විමර්ශනයක් ඉදිරිපත් කිරීම මෙහි අරමුණයි. වෙසෙසින්ම ඛුද්දකනිකායේ ඓතිහාසිකත්වය පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී බොහෝ පාලි උගතුන් සඳහන් කරන්නේ ඛුද්දකනිකාය පසුකාලීනව සූත්‍ර පිටකයට ඇතුළත් වූ බවයි. ඛුද්දකනිකායේ පොත් සියල්ලක් ම පාහේ ප්‍රථම සංගීතියෙන් පසු වරින්වර සම්පාදිත වූ ඒවාය. ඉතිවුත්තකපාළිය ප්‍රථම ධර්ම සංගීතියෙන් පසු ව සංග්‍රහ කරන ලද්දක් වශයෙන් ද සැලකේ.[3] අට්ඨකථා ආචාර්යවරු පවා මුලදී නිකාය සතරක් ගැන පමණක් කථා කළහ.[4]

කෙසේවෙතත් දීඝනිකාය අටුවාව වන සුමංගලවිලාසිනීයෙහි දී මුලින් නිකාය හතරක් ගැන සඳහන් කළ ද (කතමො ඛුද්දකනිකායො) එහි ම විවිධ ස්ථානවල නිකාය පහක් (නිකාය වසෙන පඤ්චවිධං) ගැන සඳහන් කොට ඇත.

## සාකච්ඡාව

අට්ඨක හා පාරායන වග්ග ඇතුළත් සුත්තනිපාතය හැර අනෙක් පොත් බොහොමයක් කලින්කල ඛුද්දකනිකායට එකතු වී ඇත. ත්‍රිපිටකයෙහි පැරණිතම පාලි භාෂා ලක්ෂණ ඇතුළත් වන සූත්‍ර දේශනා වශයෙන් ද සුත්තනිපාතය සැලකේ. අට්ඨක වග්ග, පාරායන වග්ග සහ ඛග්ගවිසාණසුත්ත, සුත්තනිපාතයේ පැරණි ම කොටස් සේ ගැනේ. සුත්ත නිපාතයෙහි අට්ඨක හා පාරායන වග්ගවල භාෂා

ස්වරූපය අනුව ද ඒවායේ පැරණි බව හෙළිවෙයි. පැරණි වෛදික භාෂා ශෛලියට සමාන වූ භාෂා ලක්ෂණ අට්ඨක වග්ගයෙහි බහුලය.[5] සුත්තනිපාතයේ අට්ඨක සහ පාරායන වග්ග දෙක පිළිබඳ ව අන්‍ය නිකායන්වල සඳහන් වී ඇත.[6] මේ නිසා ඛුද්දකනිකායගත පැරණිතම ග්‍රන්ථයක් වශයෙන් සුත්ත නිපාතය හැඳින්වේ. ඛුද්දකනිකායේ ග්‍රන්ථ පහළොව (15) පෙළ ගස්වා ඇති අනුපිළිවෙළ අනුව ඉතිවුත්තක පාළිය ඇතුළත් වී ඇත්තේ ඛුද්දකනිකායේ සතර වැනි (04) කෘතිය වශයෙනි. ඉතිවුත්තකපාළියට වඩා පැරණිතම පාළි භාෂා ලක්ෂණ ආදිය පෙන්නුම් කරන සුත්තනිපාතය එහි පස්වැනි ස්ථානය ගනී. මෙම ග්‍රන්ථ පහළොවෙහි අනුපිළිවෙළ සකස්කිරීමේ දී සුත්ත නිපාතයේ පෞරාණිකත්වය පිළිබඳ ව නොසලකා හැර ඇති බව පැහැදිලි වේ. තායිලන්ත සම්ප්‍රදාය අනුව ඛුද්දකනිකායට ග්‍රන්ථ දහ හතකි (17). එහි දහසය වැන්න (16) නෙත්තිප්පකරණයයි. දාහත් වැන්න පෙටකෝපදේසයයි. බුරුම සම්ප්‍රදායට අනුව ඛුද්දකනිකායට ග්‍රන්ථ දහ අටකි (18). එහ දහ අට වැන්න මිළින්දපඤ්හයයි.[7] ශ්‍රී ලාංකේය ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායට අනුව ඛුද්දකනිකායට ග්‍රන්ථ පහළොවකි.

1. ඛුද්දක පාඨ
2. ධම්මපද
3. උදාන
4. ඉතිවුත්තක
5. සුත්තනිපාත
6. විමානවත්ථු
7. පේතවත්ථු
8. ථෙරගාථා
9. ථෙරීගාථා
10. ජාතක
11. නිද්දේස
12. පටිසම්භිදා



13. අපදාන
14. බුද්ධවංස
15. චරියාපිටක

පිටකාගත සූත්‍ර ධර්ම සංග්‍රහ කොට ඇති අනෙක් කෘතිවලට වඩා ඉතිවුත්තකපාළිය විශේෂ වන්නේ මෙහි සෑම සූත්‍රයක් ම ආරම්භ වන්නේ "වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං"[8] (මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදැයි, මෙය අරහතුන් වහන්සේ විසින් දෙසන ලදැයි, මා විසින් අසන ලදි) යන අදහසින් යුක්ත වාක්‍යයන් මුල්කරගෙනය. දීඝනිකායාදි අනික් සූත්‍ර ධර්ම සංග්‍රහ කොට ඇති සෑම කෘතියක් ම ආරම්භ වන්නේ "එවං මෙ සුතං" (මා විසින් මෙසේ අසන ලදි). යන වාක්‍ය මුල්කරගෙනය. එහෙත් මෙහි සෑම සූත්‍රයක් ම ආරම්භ වන්නේ "මෙසේ කියන ලද දේ" (ඉති+වුත්තක) යන වාක්‍ය පදනම් කරගෙනය. වුත්ත හා ඉති ශබ්ද දෙක එක්කොටගෙන ඉතිවුත්තක යයි සඳහන් වෙයි.[9]

අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන් බුද්ධ දේශනාවෙහි පවතින යම් යම් ස්වරූප, අවස්ථා සහ අන්තර්ගත කාරණා පදනම් කරගෙන සමස්ත බුද්ධ දේශනාව ම විවිධ වූ අංශවලට බෙදා දක්වා ඇත. ධර්මය රස වශයෙන් එක ම රසයකි. ධම්ම විනය වශයෙන් දෙයාකාරය[10] ආදි වශයෙනි. එහිදී බුද්ධ දේශනාව අංග වශයෙන් කොටස් නවයකට (අංග වසෙන නවවිධං) බෙදා දක්වා ඇත. සුමංගලවිලාසිනීයෙහි මෙම නවාංගසත්ථුසාසනය විස්තරයේ දී යථෝක්ත ඉතිවුත්තකපාළිය පිළිබඳ ව හය (06) වැනියට සඳහන් වේ.

1. සුත්තං - දීඝනිකාය, සුත්ත නිපාතය ආදියෙහි ගද්‍යයෙන් යුක්ත බුද්ධ දේශනා
2. ගෙය්‍ය - ගද්‍ය - පද්‍ය මිශ්‍රිත ගායනා කළ හැකි සගාථක බුද්ධ දේශනා
3. වෙය්‍යාකරණ - අභිධර්මය ආදි ව්‍යාඛ්‍යානයන්ගෙන් යුක්ත බුද්ධ දේශනා

4. ගාථා - ධම්මපදය ආදි පද්‍යයෙන් පමණක් සංගෘහිත බුද්ධ දේශනා

5. උදාන - බුදු මුවින් ප්‍රකාශිත ප්‍රීති හා ඥාණය දනවන වාක්‍යය

6. ඉතිවුත්තක - මෙසේ කියන ලද්දේ වේ. නැතහොත් බුදුරඳුන් විසින් මෙසේ දේශනා කරන ලදි යන්නෙන් ආරම්භ කොට ඇති බුද්ධ දේශනා

7. ජාතක - බුදුරදුන්ගේ පූර්ව ජන්ම සම්බන්ධ කතා ප්‍රවෘත්ති

8. අබ්භූතධම්ම - අද්භූත වස්තු හා අපූර්ව දෑ පිළිබඳ ව බුද්ධ දේශනා

9. වේදල්ල[11] - ප්‍රශ්න සහ ඊට අදාළ පිළිතුරු වශයෙන් සංගෘහිත බුද්ධ දේශනා

ඉතිවුත්තකපාළියෙහි සංගෘහිත සූත්‍රයන්ට සමාන වූ සූත්‍ර අංගුත්තර සහ සංයුක්තනිකාය ආදියෙහි ද දක්නට ඇත. අංගුත්තරනිකායේ දුක නිපාතයෙහි ධර්ම සංයුත්තයෙහි අධිමුත්ති සූත්‍රය ඒ අතර ප්‍රධාන වෙයි. ඉතිවුත්තක නම් ධර්ම වර්ගීකරණය ධර්ම සංගීතිකාරකයන් වහන්සේලා "ඉතිවුත්තකපාළි" වශයෙන් ඛුද්දකනිකායට අන්තර්ගත කිරීමට පෙර එය "ඉතිවුත්තක" යනුවෙන් ම ධර්ම වර්ගීකරණයක් සහ ධර්ම සංග්‍රහයක් (දේශනා ස්වරූපයක් වශයෙන්) ත්‍රිපිටකයේ විවිධ තැන්වල විහිදී විසිරී තිබී ඇති බව මජ්ඣිමනිකායේ අලගද්දූපම සූත්‍රයෙන් මනාව පැහැදිලි වේ. අලගද්දූපම සූත්‍රයට අනුව ඇතැම් හිස් පුරුෂයෝ සුත්ත ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භූතධම්ම වේදල්ල යන ධර්ම අර්ථයෙන් සහ ප්‍රඥාවෙන් තොරව පරීක්ෂා නොකර ඉගෙන ගන්නා බවත් නුවණින් අදහස් මෙනෙහි නොකරන්නා වූ ඔවුන්ට ඒ ධර්මයෝ මැනවින් නොවැටහෙන බවත් ඔවුන් දෙස් නැගීම ප්‍රයෝජන කොට ඇත්තා වූ බවත්[12] යනුවෙන් බුදුරජාණන් වහන්සේ දක්වා ඇත. මේ අනුව ඉතිවුත්තක පාළිය ස්වාධීන කෘතියක් මෙන් සකස්ව සංගීතිකාරකයන් වහන්සේලා වෙතින් ඛුද්දකනිකායට එකතු වන්නට පෙර එය බුද්ධ ධර්මයෙහි දේශනා විලාසයක් වශයෙන් හැඳුන්වා ඇති බව පැහැදිලි වේ. අලගද්දූපම සූත්‍රය



තුළ ඉතිවුත්තක යන්න බුදුරදුන්ගේ එක් දේශනා ස්වරූපයක් විනා ඉතිවුත්තකයන්ගෙන් සකස් වූ ග්‍රන්ථයක්ය යන්න අදහස් නොකිරීම උචිතය. එම පාඨයෙහි දැක්වෙන ජාතක උදාන යන පද පිළිබඳව ද මෙසේමය. මෙබඳු ස්වරූප ඇති කොටස් බුද්ධභාෂිතය අවිභජිත වූ අවධියක ධර්මයෙහි නානාතන්හි විස්තීර්ණව නොතිබෙන්නට ඇත. ජාතක උදාන ස්වරූප ගන්නා කොටස් ද අද දක්වා සූත්‍ර පිටකයේ මෙන්ම විනය පිටකයේ ද දක්නට ලැබෙන්නේ මේ නිසාය.[13]

ඉතිවුත්තක නම් මෙම ධර්ම වර්ගීකරණය සහ දේශනා විලාසය ථෙරවාද බෞද්ධ පාලි සම්ප්‍රදායෙහි පමණක් නොව මහායාන බෞද්ධ සංස්කෘත සම්ප්‍රදායෙහි ද දක්නට ඇත. සර්වාස්තිවාදීන්ගේ විනය පිටකය තුළ "ඉතිවෘත්තක" නමින් කොටසක් ඇතුළත් ව ඇත.[14] බුද්ධ ධර්මය සංගෘහිත චීන බෞද්ධ ග්‍රන්ථයන් අතර ද "ඉතිවුත්තක" නම් වූ ග්‍රන්ථයක් ඇත. චීන බුදුසමයෙහි පෙනෙන "ඉතිවුත්තක" ථෙරවාද සම්ප්‍රදායෙහි ඉතිවුත්තකපාළියට බොහෝසෙයින් සමාන යැයි පිළිගැනීමයි. මේ අනුව ථෙරවාද-මහායාන යන බෞද්ධ සම්ප්‍රදාය දෙක ම "ඉතිවුත්තක" සහ "ඉතිවෘත්තක" නම් ධර්ම වර්ගීකරණය නැතහොත් ධර්ම දේශනා විලාසය භාවිත කරන බව ප්‍රකට වේ.

ඉතිවුත්තකපාළියට සූත්‍ර එකසිය දොළහක් (112) අන්තර්ගත වේ. සුමංගලවිලාසිනී දීඝනිකාය අට්ඨකථාවෙහි දක්වන්නේ ඉතිවුත්තක පාළියට සූත්‍ර එකසිය දහයක් (110) ක් ඇතුළත් වන බවයි. "වුත්තංහෙතං භගවතා'ති ආදිනයප්පවත්තා දවාදසුත්තරසතසුත්තන්තා ඉතිවුත්තකන්ති වේදිතබ්බං"[15] එමෙන්ම සිංහල මිලින්ද ප්‍රශ්නයට අනුව ද ඉතිවුත්තකයට අයත් වන්නේ සූත්‍ර එකසිය දහයකි (110).[16] කෙසේවෙතත් ඉතිවුත්තකපාළියට එක, දුක, තික, චතුත්ථ යනාදි වශයෙන් නිපාත සතරකින් සැදුම්ලත් සූත්‍ර එකසිය දොළහක් (112) ක් ඇති බව පිළිගැනීමයි. මෙහි එක නිපාත, දුක නිපාතය, තික නිපාත සහ චතුත්ථ නිපාත ආදි වශයෙන් "නිපාත" සතරකි. නිපාත යන්නෙන් "කොටස" යන අදහස දෙන බව මහාචාර්ය ජයවික්‍රම පවසයි.[17] මෙහි එක නිපාතයේ ධර්ම සංකල්ප වශයෙන් එක් කාරණාවක් සඳහන් වන සූත්‍ර ඇතුළත්ව ඇත. දුක නිපාතයෙහි ධර්ම සංකල්ප දෙකක් සඳහන් වන සූත්‍ර ඇතුළත්ව ඇත. තික සහ චතුත්ථ නිපාතයෙහි පිළිවෙළින් ධර්ම සංකල්ප තුන සහ හතරක් ඇතුළත් ව ඇති සූත්‍ර අන්තර්ගත

ඇත. එක නිපාතයෙහි සූත්‍ර විසි හතක් (27) ඇත. එහි වර්ග තුනකි (03).

- පඨම වග්ගයෙහි සූත්‍ර දහයකි (10).
- දුතිය වග්ගයෙහි සූත්‍ර දහයකි (10).
- තතිය වග්ගයෙහි සූත්‍ර හතකි (07).

දුක නිපාතයෙහි සූත්‍ර විසි දෙකක් ඇත.

- පඨම වග්ගයේ සූත්‍ර දහයකි (10).
- දුක වග්ගයෙහි සූත්‍ර දොළහකි (12).

ඉතිවුත්තකපාළියෙහි දීර්ඝතම සූත්‍ර සංඛ්‍යාවක් ඇතුළත් වී ඇත්තේ තික නිපාතය තුළය. එහි සූත්‍ර පනහක් (50) ක් ඇතුළත් වේ. එහි වග්ග පහකි. පඨම-දුතිය-තතිය චතුත්ථ පංචම වශයෙන් වර්ග පහ (05) තුළ සූත්‍ර දහය (10) බැගින් සූත්‍ර පනහක් (50) ක් බෙදී ගොස් ඇත.

- පඨම වග්ගයේ සූත්‍ර දහයකි (10).
- දුතිය වග්ගයේ සූත්‍ර දහයකි (10).
- තතිය වග්ගයේ සූත්‍ර දහයකි (10).
- චතුත්ථ වග්ගයේ සූත්‍ර දහයකි (10).
- පංචම වග්ගයේ සූත්‍ර දහයකි (10).

චතුක්ක නිපාතය තුළ සූත්‍ර දහතුනක් (13) ඇතුළත් වන අතර එහි කිසිදු වග්ගයක් හෝ බෙදීමක් දක්නට නොලැබේ.

ඉතිවුත්තකයේ විෂය සංකලනය හා ශෛලියේ විශේෂත්වයක් වෙයි.[18] මෙහි සූත්‍ර එකසිය දොළහ (112) එක දුක තික චතුත්ථ ආදි වශයෙන් නිපාතවලට බෙදා බුද්ධ වචනයෙහි ප්‍රකට උපදේශාත්මක දේශනාවන් ලෙස සංකලනය කොට ඇත. අංගුත්තරනිකායෙහි සූත්‍ර වර්ගීකරණය ඇත්තේ සංඛ්‍යාත්මක අනුපිළිවෙළකටය. එක දුක තික චතුත්ථ යනාදි නිපාතවලින් ප්‍රකට වන්නේ ඉතිවුත්තකපාළියෙහි ද සූත්‍ර වර්ග කර ඇත්තේ සංඛ්‍යාත්මක අනුපිළිවෙලකට යටත්ව බවය.



මෙම සංඛ්‍යාත්මක සංකලනය හා වර්ගීකරණය භාණකවරුන්ට ස්මෘතියෙහි තබා ගැනීම උදෙසා ඉතාමත් සහය වන්නට ඇත. ඉතිවුත්තකපාළියෙහි සංඛ්‍යාබද්ධ ශෛලියේ ම විකසිත රූපය අපි අංගුත්තරනිකායේ හා අභිධර්ම පිටකයේ දකිමු.[19] ථෙරවාද බුදුසමයෙහි චිරස්ථිතිය රඳාපවතින්නේ නිර්මල බුද්ධ දේශනය වාචෝද්ගත කොට පරපුරෙන් පරපුරට භාණක සම්ප්‍රදායක් වශයෙන් රැගෙන යාමෙන් අනතුරුවය. මේ අනුව සංගීතකාරකයන් වහන්සේලා ඉතිවුත්තක පාළියෙහි සංඛ්‍යාත්මක ප්‍රභේදකරණයකට මුල් තැනක් ලබා දෙන්නේ එය වාචෝද්ගත කිරීමේ අරමුණ ඇතිව බව ප්‍රකට වේ.

ඉතිවුත්තකපාළියෙහි විශේෂත්වය වන්නේ එහි ඇතුළත ගද්‍යයෙන් හා පද්‍යයෙන් යුක්ත වීමයි. මෙහි සෑම සූත්‍රයක් ම අවසන් වන්නේ ගාථාවකිනි, එමනිසා මෙය උදානවලට සමාන වේ.[20] සෑම සූත්‍රයක ම මුල භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාරන ලදි. පූර්ණ පුරුෂ විසින් මෙසේ ප්‍රකාශ කරන ලදි. මා විසින් මෙසේ අසන ලදි වශයෙන් දැක්වේ. ගද්‍යයෙන් එහි බුද්ධ වචන උපුටා දක්වා ඇත. ඉන්පසු බුදුරඳුන් විසින් මෙසේ වදාරන ලදි, ඒ සම්බන්ධයෙන් මෙසේ කියා ඇත, යනුවෙනි. මෙහි ශබ්දවල ද අල්ප වශයෙන් අපිළිවෙළක් දක්නට ලැබේ. බොහෝවිට ගද්‍ය කොටසේ ගාථාබද්ධ කොට තබා ඇත. මේ ගාථා කොටස ද බුද්ධ වචනය මෙන් ප්‍රාමාණිකත්වය දීම සඳහා එය නිගමනය කොට අවසානයේ මෙසේ ලියා ඇත. "මේ අර්ථය ද බුදුරඳුන් විසින් දේශනා කරන ලදැයි මා විසින් අසන ලදි" යනුවෙනි. මේ ආකාරයෙන් ගද්‍ය හා පද්‍ය කොටස් එකක් අනෙක හා එකතු කොට ඇත. ඉතිවුත්තකයේ සෑම සූත්‍රයක ම මේ ශෛලිය වෙයි.[21] මෙහි ගද්‍යයෙන් සහ පද්‍යයෙන් ඉදිරිපත් කරන කොටස් සෑම සූත්‍රයකට ම අයත් වේ. මෙමඟින් පද්‍යයෙන් ප්‍රකාශිත අදහස ම ගද්‍යයෙන් ද ඉදිරිපත් වේ.

අන්‍ය සූත්‍රයන්හි දැක්වෙන පරිදි පුද්ගල ස්ථාන ආදිය ඉතිවුත්තකපාළියෙහි සඳහන් නොවේ. මෙහි ඇතුළත් වන්නේ බුදුරජාණන් වහන්සේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වැඩවසන සමයෙහි බුද්ධ ශාසනයෙහි ධර්මධර උපාසිකාවන් අතර අගතැන්පත් ඛුජ්ජුත්තරා මහෝපාසිකාව විසින් ශ්‍රවණය කර ගත් ධර්මය උදේනි රජුගේ සාමාවතී ප්‍රමුඛ ස්ත්‍රීන් පන්සියයකට නැවත ප්‍රකාශ කරන

(කියාදෙන) අවස්ථාවේ දී ඇය විසින් තැබූ පාඨ ඉතිවුත්තක යැයි සැළකේ. ඛුජ්ජුත්තරා ධර්මකථික උපාසිකාවන් අතර අගතැන්පත් වූ බැවින් මේ සූත්‍ර දේශනාවන් ක්‍රමයෙන් භික්ෂුණීන් අතර ව්‍යාප්ත විය. අනඳ මහතෙරුන් මේ සූත්‍රයන් ප්‍රථම ධර්ම සංගායනාවේ දී ඉදිරිපත් කළ විට ඛුජ්ජුත්තරා විසින් මුලින් ඊට තබන ලද නිදාන පාඨය ම යෙදූ බවත් සමහරුන්ගේ පිළිගැනීම බව අටුවාවේ සඳහන් ව ඇත. ඒ කෙසේ වුවද ධර්මසංග්‍රහ මහරහතන් වහන්සේ විසින් මේ සූත්‍ර දේශනා බුද්ධ භාෂිතයන් සේම සැලකූ බවට සැකයක් නැත.[22]

භදරතිත්ථ ධම්මපාල හිමියන්ගේ පරමත්ථදීපනී අට්ඨකථාව ඉතිවුත්තකපාළියට කරන ලද අටුවාව වශයෙන් (ඉති භදරතිත්ථවාසිනා ආචරිය ධම්මපාලෙන කථා)[23] සැළකේ. අටුවාචාර්ය බුද්ධඝෝස හිමියන්ගේ සමකාලීන සහ ඊට පසුව සිටි ප්‍රසිද්ධ අට්ඨකථාචාර්යන් වහන්සේලා දෙනම අතර බුද්ධදත්ත සහ ධම්මපාල හිමියන් ප්‍රසිද්ධ වේ. බුද්ධදත්ත සහ ධම්මපාල හිමිවරු බුද්ධඝෝෂ හිමිගේ කාර්ය සම්පූර්ණ කළහ. පරමත්ථදීපනී නම් අට්ඨකථාව රචනා කළ ධම්මපාල හිමි දකුණු ඉන්දියාවේ කාඤ්චිපුරයේ උපත ලැබූවෙකි. උන්වහන්සේගේ අධ්‍යාපනය අනුරාධපුර මහාවිහාරය තුළ සිදු වී ඇත.[24] අටුවාචාර්ය ධම්මපාල හිමි පසුකාලයේ දී දකුණු ඉන්දියාවේ බදරතිත්ථ (දෙබරතොට විහාරයෙහි) නම් විහාරයට ගොස් එහි වාසය කරමින් පාලි අටුවාකරණයෙහි නියුක්ත වී ඇත. පරමත්ථදීපනී අට්ඨකථාව හුදෙක් ඉතිවුත්තකපාළියට පමණක් සීමා වූවක් නොවේ. උදාන, ඉතිවුත්තක, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා යන ග්‍රන්ථ හයට ම (06) අටුවාචාර්ය ධර්මපාලාචාර්යතුමන් කළ අට්ඨකථාව වශයෙන් පරමත්ථදීපනීය සැළකේ. අභිධර්ම පිටකයෙහි ධාතුකථා, පුද්ගල පඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ප්‍රකරණ පහේ අටුවාව ද පරමත්ථදීපනී නාමයෙන් හඳුන්වයි. ඛුද්දකනිකායේ උදාන ඉතිවුත්තක විමානවත්ථු පෙතවත්ථු ථෙරගාථා ථෙරීගාථාවලට රචනා වී ඇති අටුවාව ද පරමත්ථදීපනී නාමයෙන් හඳුන්වන බැවින් අභිධර්ම පිටකයේ ඉහත අටුවාව "පඤ්චප්පකරණට්ඨකථා" යනුවෙන් ව්‍යවහාර කෙරේ.[25] අටුවාචාර්ය ධම්මපාල හිමියන් මීට අමතරව චරියාපිටක අටුවාව, නෙත්ති අටුවාව, විසුද්ධිමග්ග ටීකාව මුල් සඟි තුනේ ටීකා ද ලියා ඇත. "නෙත්තිප්පකරණ අත්ථසංවණ්ණනා"



නම් නෙත්තිප්පකරණ අට්ඨකථාවෙහි දී ධම්මපාල හිමියන් පරමත්ථදීපනී ඇතුළු මේ සියලු අටුවාවන් "බදරතිත්ථ විහාරයෙහි" දී (දෙබරතොට විහාරයෙහි) ලියන ලද බව විස්තර කොට ඇත. නාගපට්ටනමෙහි බුද්ධ ධර්මය පිහිට වූ තැනක ධර්මාශෝක මහරජු විසින් කරවූ විහාරයක මෙම බදරතිත්ථ විහාරය පිහිටි බව නෙත්ති අටුවාවෙන් ප්‍රකට වේ.

"සද්ධම්මෝතරණට්ඨානෙ පට්ටනෙ නාගසව්හයෙ

ධම්මොසොක මහාරාජ විහාරෙ වසතා මයා"[26]

ධම්මපාල හිමි "පරමත්ථමංජුසා" නැමැති විශුද්ධිමග්ග ටීකාව රචනා කර තිබීමෙන් උන්වහන්සේ බුද්ධඝෝෂ කාලයට පසුව වාසය කළ බව ප්‍රකට වෙයි. උන්වහන්සේ වැඩ සිටි නාගපට්ටනම දකුණු ඉන්දියාවේ කාඤ්චිපුරය පිහිටි බවත් එය වර්තමාන "තන්ජෝර්" නුවර මුහුදුබඩ ප්‍රදේශයක් බවත් පිළිගනී.[27] නාලන්දා විශ්වවිද්‍යාලයෙහි අධිපති වශයෙන් කටයුතු කර ඇත්තේ ද ධර්මපාල නැමති පඬිවරයෙකි. උන්වහන්සේ මහායානික ධර්ම ග්‍රන්ථ රාශියක් රචනා කර ඇති බැවින් මුන්වහන්සේ මහායානික පඬිවරයෙක් වශයෙන් පිළිගනී. එබැවින් නාලන්දා විශ්වවිද්‍යාලයාධිපති ධර්මපාල හිමියන් පරමත්ථදීපනී අට්ඨකථාව රචනා කළ ථෙරවාද සම්ප්‍රදායෙහි ධර්මපාල හිමියන් නොවන පැහැදිලි වේ. අටුවාචාර්ය ධම්මපාල හිමියන් විසින් දීඝනිකාය, මජ්ඣිමනිකාය සංයුක්තනිකාය යන මුල් නිකාය තුනට ම කරන ලද ටීකාව "ලීනත්තප්පකාසිනී "නම් වෙයි. අංගුත්තරනිකායට කරන ලද ටීකාව "සාරත්ථමඤ්ජුසාවයි". මෙය සාරත්ථදීපනී නම් විනය ටීකාව රචනා කළ සාරිපුත්‍ර සංඝරාජයන් වහන්සේගේ රචනයකි.

### සමාලෝචනය

ඉතිවුත්තකපාළියෙහි ආරම්භක සූත්‍රය වන්නේ එහි එක නිපාතයෙහි පඨම වග්ගයේ ලෝභ සූත්‍රයයි. එහි අවසන් සූත්‍රය වන්නේ චතුක්ක නිපාතයෙහි ලෝකාවබෝධ සූත්‍රයයි. මෙහි ඇතුළත් සූත්‍ර එකසිය දොළහ ම (112) ආරම්භ වන්නේ "වුත්තං හේතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං" වැකියෙනි. එමෙන්ම සෑම සූත්‍රයක් ම අවසාන වන්නේ "අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති"

වශයෙනි. ධර්මකථික උපාසිකාවන් අතර අගතැන්පත් ඛුජ්ජුත්තරා නම් වූ ආර්ය ශ්‍රාවිකාව විසින් කොසඹෑ නුවර උදේනි රජුගේ අන්තඃපුරයෙහි විසූ සාමාවතී ප්‍රමුඛ පන්සියයක් ස්ත්‍රීන්ට තමන් දිනපතා බුදුන්ගෙන් ඇසූ ධර්මය මෙසේ යැයි දැක්වීමට පෙරාතුව ප්‍රකාශ කරන ලද මේ සූත්‍ර දේශනාවන් අනඳ මහතෙරුන් ප්‍රථම ධර්ම සංගායනාවේ දී ඉදිරිපත් කළ විට ඛුජ්ජුත්තරා උපාසිකාව විසින් මුලින් ඊට තබන ලද නිදාන පාඨය ම යොදා ඇත. එබැවින් ධර්ම සංගීතිකාරක මහරහතන් වහන්සේලා ඉතිවුත්තක සූත්‍ර දේශනා, බුද්ධ භාෂිතයන් සේම සළකා ඛුද්දකනිකායට ඇතුළත් කොට ඇත. චීන බෞද්ධ ග්‍රන්ථවල මෙන්ම සර්වාස්තිවාදීන්ගේ විනය පිටකයෙහි ද ඉතිවුත්තක වශයෙන් පාලි ඉතිවුත්තකයට පර්යාය දේශනා ඇත. ධම්මපාල හිමියන්ගේ පරමත්ථදීපනී නම් අට්ඨකථාව ඉතිවුත්තකපාළියට කරන ලද අට්ඨ කථාව වන අතර ඉතිවුත්තකපාළිය ඛුද්දකනිකායට අන්තර්ගතවීමට පෙර එය ත්‍රිපිටකයෙහි නොයෙක් තැන්හි බුද්ධ ධර්මයෙහි දේශනා විලාසයක් හෙවත් දේශනා ස්වරූපයක් වශයෙන් විස්තීර්ණ ව තිබී ඇත.

## ආන්තික සටහන්

1. නපුංසක ලිංග පදයකි/කුඩය, කොටස, පැස, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි-සිංහල අකාරාදිය, 1998, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 341 පිටුව.
2. නපුංසක ලිංග පදයකි/ කොටස, පංතිය, සමූහය, මඩිතියවෙල සිරි සුමංගල හිමි, පාලි-සිංහල ශබ්දකෝෂය, 335 පිටුව. https://pitaka.lk/dict/
3. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, 2005, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 88 පිටුව.
4. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 27 පිටුව.
5. ප්‍රේමසිරි, පී, ඩී, සුත්තනිපාතය, 2010, බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, මහනුවර, 03 පිටුව.
6. සුනාපරන්තක පුණ්ණ තෙරුන් වහන්සේ බුදුන් වහන්සේ දැකීම සඳහා සැවැත් නුවරට පැමිණි අවස්ථාවේ දී බුදුරදුන් ඉදිරියේ දී "අට්ඨක වග්ගය" කටපාඩමෙන් කීවේ යැයි විනය පිටකයෙහි ද වේළුකණ්ටකී නන්දමාතා නැමැති උපාසිකාව



"පාරායණය" කටපාඩමින් කියනු වෙස්සවුණු රජ අසාගෙන සිටි ඇයි අංගුත්තරනිකායේ සත්තක නිපාතයේ දක්වා තිබේ., බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, 83 පිටුව.

7. Jayawardhana, Somapala, Hand Book of Pali Literautre, 1994, Karunaratne and sons Ltd, Colombo, 73 page.
8. "මෙම වාක්‍යයෙහි "මෙ" යන්නෙන් අදහස් කෙරෙන්නේ ආනන්ද මහරහතන් වහන්සේ බවත් එම නිසා සෑම සූත්‍රයක් ම ආනන්ද මහතෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙතින් ඇසූ විලසින් ධර්ම සංග්‍රාහක මහරහතුන් වෙත ප්‍රකාශ කරන ලද බවත් ("ඉති මෙ සුතං" යන්නෙන් භාග්‍යවතුන් වහන්සේ ඉදිරිපිටදී ම ආනන්ද මහතෙරුන් වහන්සේ ඒ ඇසූ වගක් ප්‍රකාශ වන බවත්) ඇතමෙක් වරදවා වටහා ගනිති. පරමත්ථදීපනී ඉතිවුත්තක අට්ඨකථාව මීට වෙනස් වූ මතයක් ඉදිරිපත් කරයි. වුත්තං හෙතං භගවතා යනාදී වූ නිදාන පාඨය සැලකිය යුත්තේ පළමුවෙන් ආනන්ද මහරතන් වහන්සේ විසින් වදාරන ලද්දක් වශයෙන් නොව, මෙම සසුනෙහි ධර්මකථික උපාසිකාවන් අතර අගතැන්පත් ඛුජ්ජුත්තරා නම් වූ ආර්ය ශ්‍රාවිකාව විසින් කොසඹෑ නුවර උදේනි රජුගේ අන්තඃපුරයෙහි විසූ සාමාවතී ප්‍රමුඛ පන්සියයක් ස්ත්‍රීන්ට තමන් දිනපතා බුදුන්ගෙන් ඇසූ ධර්මය මෙසේ යැයි දැක්වීමට පෙරාතුව ප්‍රකාශ කරන ලද්දක් වශයෙනි".,ඉතිවුත්තකපාළි (සංඥාපනය) ,1970,
9. ඛුද්දකනිකාය, ඉතිවුත්තකපාළිය, 2013, කෝදාගොඩ ඥානාලෝක හිමි, සංඥාපනය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව පුනර්මුද්‍රණය, බණ්ඩාරගම.
10. "එවමේතං සබ්බංපි බුද්ධවචනං රසවසෙන එකවිධං. ධම්මවිනය වසෙන දුවිධං. පඨම මජ්ඣිමපච්ඡිමවසෙන තිවිධං. තථා පිටක වසෙන, නිකාය වසෙන පංචවිධං. අංග වසෙන නවවිධං. ධම්මක්ඛන්ධ වසෙන චතුරාසීතිසහස්සවිධන්ති වෙදිතබ්බං" සුමංගලවිලාසිනි දීඝනිකාය අට්ඨකථා, 1918, සයිමන් හේවාවිතාරණ මුද්‍රණය, 12 පිටුව.
11. කථං අඞ්ග වසෙන නවවිධං? සබ්බමෙව හිදං සුත්තං ගෙය්‍යං ව්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භූතධම්ම වේදල්ලන්ති නවප්පභේදං හොති ......... සුමංගලවිලාසිනී දීඝනිකාය අට්ඨකථා, 1918, සයිමන් හේවාවිතාරණ මුද්‍රණය, 18 පිටුව.
12. ඉධ භික්ඛවේ එකච්චේ මෝඝ පුරිසා ධම්මං පරියාපුණන්ති. සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වේදල්ලං. තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං න උපපරික්ඛන්ති.,

මජ්ඣිමනිකාය, මූල පණ්ණාසකය, අලගද්දූපම සූත්‍රය, 2013, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 334 පිටුව.

13. සිංහල විශ්වකෝෂය, තුන්වෙනි කාණ්ඩය, 1998, සංස් - ඩී. ඊ. හෙට්ටිආරච්චි, සංස්කෘතික දෙපාර්තමේන්තුව, 513 පිටුව.

14. ඉතිවුත්තකපාළි, 1970, සංස් -ලබුහේන්ගොඩ චන්දරතන හිමි, සංඥාපනය, සමස්ත ලංකා බෞද්ධ මහාසම්මේලනයේ ත්‍රිපිටක පාලි ග්‍රන්ථ මාලාව, කොළඹ, 12 පිටුව.

15. සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා.

16. නාරම්පනාව, කීර්ති, සිංහල සූත්‍ර පිටකයට පෙරවදනක් , 1998, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 108 පිටුව

17. ප්‍රේමසිරි, පී, ඩී, 03 පිටුව.

18. උපාධ්‍යාය, භරතසිංහ, පාලි සාහිත්‍යයේ ඉතිහාසය, 2003, සංස් - හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, ගොඩගේ පොත් මැඳුර කොළඹ- 10, 98 පිටුව.

19. එම, 198 පිටුව.

20. Hinuber, Oskar Von, A Hand Book of PAli Literature, 2001, Munshirum Manoharal Publisher Pvt. Ltd. New Delhi, 47 page

21. එම, 199 පිටුව.

22. එම

23. Jayawardhana, Somapala, 58 page.

24. උපාධ්‍යාය, භරතසිංහ, 443 පිටුව.

25. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍යය, 192 පිටුව.

26. එම, 199 පිටුව.

27. එම